දුරකථන - 0112669192 , 0112675011
தொலைபேசி - 0112698507 , 0112694033
Telephone - 0112675449 , 0112675280

ෆැක්ස් - 0112693866
பெக்ஸ் - 0112693869
Fax - 0112692913

විද්‍යුත් තැපැල - postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி -
e-mail -

වෙබ් අඩවිය - www.health.gov.lk
இணையத்தளம் -
website -


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health


මගේ අංකය -
எனது இல - TCS/SA/2022(VIII)
My No.

ඔබේ අංකය -
உமது இல -
Your No. : -

දිනය -
திகதி -
Date - 2023. 11 27


පොදු චක්‍ර ලේඛ ලිපි අංක 02 - 178 /2023

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සිලුම රෝහල් අධ්‍යක්ෂවරුන්, වෛද්‍ය අධිකාරීන්
සියලුම රෝහල්වල ආයතන ප්‍රධානීන්,
විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරීන්,
සියලුම වෛද්‍ය නිලධාරීන්,

**මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පදවන රියදුරන් මහ මගදී පරීක්ෂා කිරීම සහ එම රියදුරන් වෛද්‍ය නිලධාරීන් වෙත ඉදිරිපත් කළ විට අනුගමනය කළ යුතු මාර්ගෝපදේශය**

මාර්ග අනතුරු අවම කර ගැනීමේ උපක්‍රමයක් ලෙස ශ්‍රී ලංකා පොලීසිය විසින් මත් ද්‍රව්‍ය භාවිතා කර රිය පදවන රියදුරන් හදුනා ගැනීමේ "නියමු ව්‍යාපෘතියක්" ප්‍රවාහන සහ මහා මාර්ග අමත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලීසිය සහ අදාල වෙනත් ආයතන සමඟ ඒකාබද්ධව රට පුරා සිදු කිරීමට පියවර ගෙන ඇත. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පූර්ණ සහයෝගය ලබා දීමට තීරණය කර ඇත. එම ක්‍රියාවලියේදී රෝහල් වල සේවය කරන වෛද්‍ය නිලධාරීන්ගේ (MO A&E, ETU, PCU, OPD, JMO and No Call MO) දායකත්වය අවශ්‍ය වන අතර, ඒ සඳහා පහත සඳහන් ක්‍රියාවලිය අනුගමනය කරන අතර, අදාල ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා සිටිමි.

**01.** පොලිස් නිලධාරීන් විසින් සැක සහිත රියදුරන් පරීක්ෂා කර, මත් ද්‍රව්‍ය භාවිතා කර තිබේද යන්න හදුනා ගැනීම සඳහා ක්ෂණික බේටය පරීක්ෂාවක් සිදු කෙරේ.

**02.** එම පරීක්ෂාවෙන් තහවුරු වන,මත් ද්‍රව්‍ය භාවිත කල බවට ලක්ෂණ ඇති, සැකකාර රියදුරන් රෝහල වෙත රැගෙන එනු ඇත.

**03.** එලෙස රැගෙන එන සැකකාර රියදුරන් වෛද්‍යවරයෙකු විසින් පරීක්ෂා කර, අදාල වෛද්‍ය වාර්තාව ලබා දිය යුතු වන අතර ප්‍රධාන වෛද්‍ය නිලධාරියා හෝ, අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු සිටීනම් ඔහු විසින් පරීක්ෂා කර අදාල පත්‍රිකා පුරවා අධිකරණ ක්‍රියාදාමයට සහාය වීම වඩාත් යෝග්‍ය වේ.

**04.** රැගෙන එන සැකකාර රියදුරන්ගේ මූත්‍රා සාම්පල පරීක්ෂා කර තහවුරු කිරීම වෛද්‍ය නිලධාරියෙකු විසින් සිදු කල යුතු අතර, අදාල පරීක්ෂණ කට්ටල පොලීසිය විසින් රෝහලට ලබා දෙනු ඇත. ළගම ඇති පොලිස් ස්ථානය සමග සාකච්ඡා කර , කලින්ම එම මූත්‍රා පරීක්ෂණ කට්ටල ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලබා ගෙන නියමිත උෂ්ණත්වයේ ගබඩා කර රෝහල් වල තබා ගත යුතුය.

**05.** එලෙස පරීක්ෂා කර අදාළ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පත්‍රිකාව (MLEF) සහ නියමු ව්‍යාපෘතියට අදාල පෝරමය පුරවා අදාල කොටස් රෝහලෙහි තබා ගෙන පොලිස් නිලධාරීන්ට ලබා දෙන කොටස පොලිසිය වෙත ලබා දිය යුතුය.

**06.** වැඩිදුර පරීක්ෂා කිරීමට ගන්නා මූත්‍රා සාම්පල සහ වෙනත් සාම්පල නිසි ලෙස ලේබල් කර, රජයේ රස පරීක්ෂක වෙත හෝ අන්තරාදායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත යැවීම සිදු කල යුතුය. මෙම සාම්පල යැවෙන තෙක් ගබඩාකර තබා ගැනීමට සහ ප්‍රවාහනය කිරීමට ක්‍රමවේදයක් රෝහල් බලධාරීන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු සහ අදාල පොලිස් නිලධාරීන් සමග සාකච්ඡා කර සකස් කර ගත යුතු අතර සියළු සාම්පල එකතු කර, නිසි පරිදි අසුරා එකවර යැවීම වඩාත් සුදුසු වේ. සාම්පල ගබඩාකිරීම සහ ප්‍රවාහනය පිළිබඳ විස්තර මේ සමග ඇති ඇමුණුමේ සඳහන් වේ.

**07.** සාම්පල ලේබල් කිරීමේදී පහසුවෙන් හඳුනා ගත හැකි වන පරිදි රියදුරු බලපත්‍රයේ සඳහන් පරිදි නම, රියදුරු බලපත්‍රයේ අංකය, නැතහොත් ජාතික හැඳුනුම්පත් අංකය, සාම්පලය ලබා ගත් දිනය, රෝහලෙහි නම යෙදීම වඩාත් යෝග්‍ය වේ.

**08.** නිසි පරිදි සම්පූර්ණ කරන ලද පරීක්ෂණ පත්‍රිකාව සහ අදාල සාම්පල රස පරීක්ෂක වෙත හෝ අන්තරාදායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත යවන අතර, එම පරීක්ෂා කරන ලද රියදුරන්ගේ විස්තර ඇතුලත් ලේඛණයක් සෑම ආයතනතකම පවත්වා ගත යුතුය. අදාල අවශ්‍ය කරන අවස්ථාවේදී අධිකරණය වෙත වාර්තා ඉදිරිපත් කිරීම සඳහා තොරතුරු රෝහලෙහි තබා ගැනීම ඉතා වැදගත් වේ. <u>අධිකරණ කටයුතු සඳහා යොදාගන්නේ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පත්‍රිකාව **(MLEF)** පමණි</u>.

**09.** අවශ්‍ය අවස්ථාවන්හිදී පොලිස් දෙපර්තමේන්තුවෙහි ප්‍රාදේශිය නිලධාරීන්, අන්තරාදායක ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි නිලධාරීන් සමග සහයෝගයෙන් රෝහල් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම රෝහල් අධ්‍යක්ෂවරුන්, වෛද්‍ය අධිකාරීවරුන් සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

**10.** මාර්ග අනතුරු වලින් මියයන, සදාකාලික සහ දීර්ඝ කාලීනව අබාධිත වන මාරාන්තික තුවාල ලබන රෝගීන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල බරක් වන බැවින් රිය අනතුරු අවම කර ගැනීම සඳහා මෙම වැඩපිළිවෙල ඉතා වැදගත් වන බව නිරීක්ෂණය වේ. එබැවින් ප්‍රදේශයේ අධිකරණ විශේෂඥ වෛද්‍ය නිලධාරීන් හා අත්දැකීම් ඇති, පලපුරුදු ආයතන ප්‍රධානීන් හා එක්ව මෙම වැඩ පිලිවෙල සඳහා පූර්ණ සහයෝගය ලබා දෙන ලෙස දන්වා සිටිමි. වැඩිදුර විස්තර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (වෛද්‍ය සේවා) වෛද්‍ය ප්‍රියන්ත අතපත්තු මහතාගෙන් හෝ බෝනොවන රෝග ඒකකයේ විශේෂඥ වෛද්‍ය සමිත සිරිතුංග මහතා වෙතින් ලබා ගත හැකි බවද තවදුරටත් දන්වා සිටිමි.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

# Guideline for Conducting Drug Screening Tests

## Sample Storage and Transport

### Storage:

- If the specimen needed to store for a short time, it should be appropriately safeguarded during temporary storage in a refrigerator at a temperature of about $4^0$ C.
- The specimen should normally be transported within 48 hours and storage should not be no longer than one week after it has been placed in storage. If stored longer, the temperature should be minus twenty degree Celsius ($-20^0$ C).

### Transport:

- The sample shall be labeled with the details of the driver and samples require to send for confirmatory analysis as soon as possible.
- The samples shall be placed in containers designed to minimize the possibility of damage during transportation for example, specimen boxes or padded mailers.
- Those containers shall be securely sealed preferably in the presence of a Witness to eliminate the possibility of undetected tampering. On the tape sealing the container, shall sign and enter the date specimens were sealed in the containers for shipment.
- The appropriate documentation for each transport bag/container should complete to ensure that the laboratory can verify the contents, and follows the Sample Collection Authority's system to ensure that analysis instructions (e.g. type of analysis to be done) are provided.

DRAFT - NDDCB

මගේ අංක - TCS/SA/2022 (VIII)
"සුවසිරිපාය"
සෞඛ්‍ය අමාත්‍යාංශය
385, බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ - 10
2023.11. 23

ප්‍රධාන ලේකම්තුමා,දකුණු පළාත
සෞඛ්‍ය ලේකම්තුමා දකුණු පළාත
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක, දකුණු පළාත
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ගාල්ල, මාතර සහ හම්බන්තොට
අධ්‍යක්ෂ - ශික්ෂණ රෝහල, කරාපිටිය,මහරෝහල මාතර, හම්බන්තොට,
වෛද්‍ය අධිකාරී - මූලික රෝහල, බලපිටිය, ඇල්පිටිය, උඩුගම, කඹුරුගමුව, දෙනියාය, තංගල්ල, වලස්මුල්ල.
තිස්සමහාරාමය
දකුණු පළාත තුල සේවය කරන විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරීන්,
අදාල ආයතන ප්‍රධානින්,

**<u>මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පදවන රියදුරන් මහ මගදී පරික්ෂා කිරීමට අදාල නියමු ව්‍යාපෘතිය- දෙවන අධියර දකුණු පලාත තුල ක්‍රියාත්මක කිරීම</u>**

මෙම කරුණ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අතිරේඛ ලේකම් (සංවර්ධන) ගේ අංක SMT/2/Legal/R-DMT/Case 06 දරන 2023.11.07 දිනැති ලිපිය හා බැදේ.

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී රියඅනතුරුවලින් මිය යන ජීවිත අවම කර ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වන බැවින් මෙම වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය පූර්ණ සහයෝගය ලබා දිය යුතුව ඇත. ඒ අනුව 2023.11.14 දින ඔබ පළාතේ නිලධාරීන් සමග මාර්ගගත ක්‍රමයෙන් මේ සම්බන්ධව පැවති රැස්වීමේදී සාකච්චා කරන ලද පරිදි ඔබ පළාතේ අදාල රෝහල් නිලධාරීන් දැනුවත් කර අදාල පොලිස් ස්ථානය සමග සම්බන්ධීකරණය වෙමින් කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

මෙම නියමු වැඩසටහන 2023.12.01 දින සිට දකුණු පළාත තුල ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව සහ වෙනත් අදාල සංස්ථාන වල සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

එදිනට රෝහල් වෙත රැගෙන එන රියදුරන් පරික්ෂා කිරීම සෑම වෛද්‍ය නිලධාරියකුගේම වගකීම වන අතර අදාල පරීක්ෂණ සිදුකර පොලිස් ටිකට්පත පුරවා සහ නියමු ව්‍යාපෘතියට අදාල සමීක්ෂණ පත්‍රිකාවද පුරවා දෙන ලෙස දන්වන අතර රස පරීක්ෂක වෙත යැවීම සඳහා ගනු ලබන සාම්පල නිසි පරිදි ගබඩා කර රස පරීක්ෂක වෙත යැවීම සඳහා ප්‍රවාහන පහසුකම් සලසා දෙන දන්වා සිටිමි. මේ සඳහා සහයෝගය අවශ්‍ය කරන රෝහල් ලැයිස්තුව මේ සමග එවන අතර සේවා අවශ්‍යතාවය පරිදි සාකච්චා කර ගනිමින් අදාලවන නව රෝහල් හදුනාගෙන කටයුතුකරන ලෙසද දන්වා සිටිමි. එදිනට සිදුකරන කාර්යන් පිලිබදව මාර්ගෝපදේශයක් එවීමට කටයුතු කරමි. මෙම වැඩසටහන පිලිබදව වැඩිදුර විස්තර අධ්‍යක්ෂ තෘතියික සත්කාර සේවා <u>වෛද්‍ය ප්‍රියන්ත අතපත්තු මහතාගෙන්</u> හෝ බෝ නොවන රෝග ඒකකයේ විශේෂඥ <u>වෛද්‍ය සමිත සිරිතුංග</u> මහතා වෙතින් ලබා ගත හැකිය.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්,
1) ගරු ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා - කාරුණික දැනගැනීම සඳහා
2) අතිරේඛ ලේකම් සංවර්ධන, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය -කාරුණික දැනගැනීම සඳහා
3) ජොෂ්ඨ පොලිස් අධිකාරී, දකුණු පළාත - අවශ්‍ය කටයුතු සඳහා
4) පොලිස් අධිකාරීවරු ගාල්ල, මාතර, හම්බන්තොට - අවශ්‍ය කටයුතු සඳහා